# බූගූඩා



ජානකී සූරියආරච්චි





කතාව චිත්‍ර පරිගණක අක්ෂර සහ පරිගණක වර්ණ සංයෝජනය

**ජානකී සූරියආරච්චි**


**ස්තුතිය !**


මගේ පොත් වල අඩුපාඩු නොබැලුවද නිතරම මා ළඟ හිඳිමින් මගේ සියලු දුක සැප බලන මගේ ආදර අම්මාටත්, මා ඉල්ලන, හැකි සියලු දේ මට ලබාදෙන මගේ ආදර තාත්තාටත්, “හරිම කරදරේ” කියමින් වුවද, මට නිරතුරුවම උදව් කරන (මගේ එකම පොතක් වත් කියවා නැති) මගේ ආදර මල්ලීටත්, මට අකුරු කියාදී මඟ පෙන්වූ මගේ ආදර ආච්චීටත්, මට සෙවනැල්ලක් මෙන් සිටින මගේ ආදර ලොකු අම්මාටත්, මගේ කතන්දර කියවා අඩුපාඩු පෙන්වාදෙන මගේ ආදර මිතුරු මිතුරියන්ටත්, භාෂාවේ මා නොදත් දේ මට හොඳින් කියාදුන් මහාචාර්ය ජේ. බී. දිසානායක මහතාට හා මහාචාර්ය කුසුමා කරුණාරත්න මහත්මියටත්, කලට වේලාවට මුද්‍රණ කටයුතු නිමකර දුන් පාලිත පෙරේරා මහතාටත්, වචනයකින් හෝ මා දිරිමත් කළ සියලුම දෙනාටත් මාගේ හෘදයංගම ස්තුතිය !



**ජානකී සූරියආරච්චි**

1490/8, හෝකන්දර පාර,

පන්නිපිටිය.

Tel: 94-11-2847438



© ජානකී සූරියආරච්චි



ISBN: 955-1090-04-7

**Book Ref: T/06/008**

# බුහුකි



බුහුකි පුංචි වඳුරු පැටියෙක්.
බුහුකිගේ අම්මාටයි තාත්තාටයි හිටියෙ බුහුකි විතරයි.
එයාලාගෙ රංචුවෙ හිටි පුංචිම පැටියත් බුහුකි.
ඒ නිසා එයාට හැමෝම ආදරෙයි.



පුංචිම කාලෙ එයා ගහෙන් ගහට ගියේ අම්මාගේ බඩේ එල්ලිලා.
සමහර දවසට හොඳ නින්දකුත් නිදාගෙනයි යන්නෙ.
අම්මා ගහෙන් ගහට පනිනකොට බුහුකි හයියෙන් අම්මා
අල්ලා ගන්නවා.



ටිකක් ලොකු වුණාම බුහුකි තාත්තාගෙ කර උඩ නැගලයි ගියේ.
එතකොට තාත්තා කියා දුන්නා ගහෙන් ගහට පනින හැටි,
ලිස්සන්නෙ නැති වෙන්න ගස් අල්ලාගන්න හැටි.
දැන් බුහුකිට හොඳට ගහෙන් ගහට පැනලා යන්න පුළුවන්.



බුහුකිගෙ සීයා, ඒ කියන්නෙ වඳුරු මුත්තා
වයසට ගියත් තවමත් ගහෙන් ගහට පැන පැන යනවා.
බුහුකිගේ සීයාට සුදු පාට රැවුලකුත් තිබුණා.

හැමදාම හවසට සීයා බුහුකිට ලස්සන කතන්දර කියා දෙනවා.
ගඟ අද්දර තියෙන කජු ගහට නැගලා සීයායි බුහුකියි තරගෙට කජු පුහුලම් කනවා. කාලා කජු ඇට විසි කරනවා, පහළ ගෙදර මිදුලට.
ඒ ගෙදර චූටි බබාලා මිදුලට ඇවිත් ඒ කජු ඇහිඳ ගන්නවා.
සමහර වෙලාවට බුහුකි පැණි බේරෙන කජු පුහුලම් කඩලා බබාලා ළඟටත් විසි කරනවා. පුංචි බබාලා රස කර කර ඒවා කනවා.
එයාලාට මේ ගස්වලට නගින්න බැහැ නේ.





චූටි බබාලා බුහුකි එක්ක හරි යාලුයි.
බබාලා බුහුකිට අත වනනකොට බුහුකිත් බබාලාට අත වනනවා.
සමහර දාට බුහුකි බබාලාට විහිළු කරනවා.
- මූණ ඇද කරලා - කට ඇද කරලා -
එතකොට බබාලාට හරිම හිනා. බුහුකිටත් හිනා.
"බුකු - බුකු - බුකු - බුකුං - බුකුං -----" බුහුකි හිනාවෙනවා.

බබාලා බුහුකිට කෙසෙල් ගෙඩියක්, අඹ ගෙඩියක් විසි කරනවා.
බුහුකි පැනලා ඒවා අල්ලා ගන්නවා. බුහුකි කෙසෙල් ගෙඩිය ලස්සනට
ලෙලි ඇරලා කනකොට චූටි බබාලාට හරි සතුටුයි.
ඒත් බබාලාගෙ අම්මලා තාත්තලා එනකොට නම් බුහුකි හොරා වගේ
පැනලා දුවනවා.

"අන්න ! අන්න ! වඳුරු මුත්තලා එනවා."
බුහුකිලා එනකොට බබාලා එළියට බැහැලා කෑ ගහනවා.
"අන්න පුංචි වඳුරු මුත්තෙක් !"
දවසක් එක පුංචි බබෙක් බුහුකි පෙන්නලා කීවා.
එදා නම් බුහුකිට තරහා ගියා.
මට වඳුරු මුත්තා කියන්නෙ ඇයි ? මම තවම පුංචි වඳුරු බබා නේ.
ඒත් ඒ බබාලා හරි හොඳයි නේ. ඒ නිසා බුහුකි තරහා වුණේ නෑ.
බබාලා හොඳ වුණාට එයාලාගේ අම්මලා තාත්තලා නම් හරි වසයි.
බුහුකිලාගෙ රංචුව යනකොට මොනවාදෝ පත්තු කරලා දානවා.
අකුණු ගහනවා වගේ හරි සද්දෙයි.



"ඩෝං - ඩෝං - "
හරි සද්දෙට පිපිරෙනවා. බුහුකිලා ඒවාට හරිම බයයි.
"බුහුක් - බුහුක් - බුහු - බුහු - බොහෑ--බොහෑ----"
කියලා බුහුකිලා කෑ ගහගෙන දුවනවා.
එතකොට ගෙවල්වල මිනිස්සු එළියට බැහැලා බලාගෙන ඉන්නවා.
"මේ වඳුරො රංචුව එක්ක හරි කරදරේ.
ගහක ගෙඩියක් තියාගන්න බෑ." එයාලා බුහුකිලාට බනිනවා.
"මේ තරම් අඹ, කෙසෙල්, වරකා, කජු පුහුලම් තියෙද්දි අපි එකක් දෙකක් කෑවාම ඔය තරම් පාඩු වෙනවද ?" බුහුකිට හිතෙනවා.



“මිනිස්සු පැවත එන්නෙ වඳුරන්ගෙන් !” දවසක් බුහුකිගේ සීයා කීවා.
“ඒ කියන්නෙ ?” බුහුකි ඇහුවා.
“ඒ කියන්නෙ මිනිස්සු ඉස්සර අපේ නෑදෑයෝ.” සීයා කීවා.
“එහෙනම් අර පහළ ගෙදර බබාලා අපේ නෑදෑයෝ ද?” බුහුකි ඇහුවා.
“ඔව් !” සීයා කීවා.
“ඒත් ඒ බබාලාට අපිට වගේ දිග වලිගයක් නැහැ නේ ?”
“එයාලාගේ වලිගෙ ගොඩක් ඉස්සර හැලිලා, ඒ බබාලාගෙ මුතුන් මිත්තන්ගෙ කාලෙදි.” සීයා බුහුකිට කීවා.

"ඒත් ඇයි එයාලා කකුල් දෙකෙන් යන්නෙ? අපි වගේ කකුල් හතරෙන් ගහෙන් ගහට පැන පැන යන්නෙ නැත්තෙ ඇයි ?"
බුහුකිට ප්‍රශ්න ගොඩයි.
"මං දන්නෙ නෑ ළමයො ඕවා !"
සීයා කැමති නෑ එයා දන්නෙ නැති දේවල් බුහුකි අහනවට.
"එහෙනම් ඇයි එයාලා ඇඳුම් අඳින්නෙ ? අපි අඳින්නෙ නැත්තෙ ?"
බුහුකි තවත් ප්‍රශ්නයක් ඇහුවා.
"මම දැන් එක පාරක් කීවා නේද මම දන්නෙ නෑ කියලා.
යනවා යන්න අහකට."
සීයාට හොඳටම තරහා ගිහින් බුහුකිට බැනලා එළවා ගත්තා.
සීයා බැන්නාම බුහුකිට දුක හිතුනා.
"ම්හ් ! ම්හ් ! සීයා මට ආදරේ නෑ."
බුහුකිට ඇඬෙන්නත් වගේ.



එයා ගහෙන් ගහට පැන පැන ගිහින් ගඟ අද්දර කජු ගහට ආවා. ගඟට නැමුණු කජු අත්තට නැංගා. නැට්ටෙන් කජු අත්තේ එල්ලිලා ඔළුව පහතට දාගෙන ගඟේ ඉන්න මාළු ගණන් කර කර හිටියා. හරි කම්මැලියි. පහළ ගෙදර චූටි බබාලාවත් පෙනෙන්න නෑ. ඉස්කෝලේ ගිහින් වෙන්න ඇති.



"මේ වෙලාවට මොනවා හරි රස කෑමක් කන්න තිබුණා නම්."
බුහුකිට හිතුනා.
එයා වටපිට බැලුවා.
වැට අයිනේ කෙසෙල් කැනක් නම්
කහ පාටට පෙනෙනවා. ඒත් ඕනෙ නෑ.
කෙසෙල් හැමදාමත් කනවා නෙ.
"එහෙනම් කජු පුහුලමක් ?"
ඒත් බෑ, ඒවා ඇඹුල්.
බුහුකි හිත හිතා ඉන්නවා.



ඔහොම හිත හිතා ඉන්නකොට
බුහුකි දැක්කා චූටි බබාලාගෙ
ගේ පිටි පස්සෙ ගහක කපුටෝ රෑනක් පොරකනවා.
ඒකත් එකටම රස කෑමක් වෙන්න ඇති.

ආ ! මේ පැණි වරකා ගහේ නෙ කපුටෝ කෑ ගහන්නෙ ?
"ස්--ස්--ස්---"
පැණි බේරෙන වරකා ගෙඩියක් ! සුවඳේ බෑ !
බුහුකිගෙ කටට කෙල ඉනුවා.
වරකා මදුලක් කාපු දවසක්වත් මතක නෑ.





බුහුකි අඩියට දෙකට පැනගෙන ගියා වරක ගහ දිහාට.
කපුටෝ ටික බුහුකි දැකලා අයිනට වුණා.
බුහුකි චණ්ඩියා වගේ ගිහින් වරකා ගෙඩිය කන්න ලැහැස්ති වුණා.
පැත්තකට වෙලා හිටි කපුටන්ට හොඳටම තරහා ගියා.

"බුහුකි දැන් මේ වරකා ගෙඩිය තනියම කයි. මේක සොයා ගත්තෙ අපි.
හොඳ වැඩක් කරන්න ඕනෙ බුහුකිට." කපුටෝ කතා වුණා.

ඊට පස්සෙ බුහුකිට වරකා මදුළු දෙක තුනක් වත් කන්න ලැබුණෙ නෑ,
කපුටු රෑන වටවෙලා බුහුකිගෙ ඔළුවට කොටන්න පටන් ගත්තා.
හරියට ටොකු අනිනවා වගේ. ජීවිතේට මෙහෙම නම් ටොකු කාලා නෑ.
බුහුකි වරකා ගෙඩිය බදාගෙන කෑ ගැහුවා.

බුහුකි වරකා ගෙඩියෙ එල්ලෙනකොට ම ඒක නැට්ටෙන් කැඩිලා
ඔළුව උඩට වැටුණා.
එයාගෙ ඇඟ පුරාම වරකා පැණියි කොහොල්ලෑයි ගෑවිලා.
කපුටො කොටනවා මදිවට වරකා ගෙඩියත් ඔළුව උඩට වැටිලා,
ඔළුව රිදෙනවා.
බුහුකි කෑ ගහගෙන දිව්වා.
"බුහුක් - බුහුක් - බොහ් - බොහ් - බොහෑ --- බොහෑ----"

කපුටු රංචුව පස්සෙන් එළවාගෙන එළවාගෙන ගියා.
"කාක් - කාක් - කාක් - කාක් - "



එතකොටම බුහුකි දැක්කා, චූටි බබාලාගෙ අත්තම්මා පුළුන් කන්දක් මිදුලෙ වේලෙන්න දාලා තියෙනවා.
මේක අස්සෙවත් හැංගෙන්න ඕනෑ කියලා බුහුකි පුළුන් ගොඩේ රිංගුවා.
වරකා පැණියි කොහොල්ලෑයි වලට බුහුකිගෙ මුළු ඇඟ පුරාම සුදු පාට පුළුන් ඇළුණා. නහයෙයි කටෙයි  හැම තැනම පුළුන් ගියා.
"පුහ් - පුහ් - චුහ් - තුහ් - පුහ් -"
බුහුකි ඒවා පිහිදාන්න හැදුවා. එතකොට තව තවත් ගෑවුණා.
දැන් නම් බුහුකිව අඳුනන්නත් බෑ.
සුදු පාට පුළුන් බෝලයක් වගේ.



මොකක්ද මේ සද්දෙ කියලා බලන්න චූටි බබාලාගෙ අත්තම්මා මිදුලට ආවා.

"අම්මෝ----!"
බබාලාගේ අත්තම්මා බුහුකිට බයවෙලා කෑ ගැහුවා.
අත්තම්මාගේ කෑ ගැහිල්ලට එළියට ආ ගෙදර අනෙක් අයත් බුහුකි දැකලා කෑ ගහගෙන දිව්වා.

"හා--හාපෝ--යි-----මෙන්න අමුතු සතෙක් ඇවිල්ලා !"
අල්ලපු ගෙවල්වල අයත් දිව්වා.



මේ කෑ ගැහිල්ලට බය වුණු බුහුකි ගෙදර දුවන්න හැදුවා.
කලබලේට අමතක වෙලා බුහුකි දුවන්න හැදුවේ වරක ගහ ළඟින්මයි.
එයා වරකා ගහ පැත්තට එනවා දැකපු කපුටෝ ටික හිතුවා,
ආයෙත් මේ සුදු පාටට පුළුන් ගාගෙන එන්නෙ අපිව රවට්ටගෙන වරකා කන්න තමයි කියලා.
ඉතින් කපුටු රෑන ආයෙත් බුහුකිගෙ පස්සෙන් එළවන්න පටන් ගත්තා.
බුහුකි ආපහු හැරිලා දිව්වා.



දුවලා ගිහින් කුස්සිය පිටිපස්සෙ වළං මැස්සෙ දාලා තිබුණු මුට්ටියක් අරගෙන ඔළුවෙ නවා ගත්තා.
"දැන් හරි ! දැන් මං එක කපුටෙකුටවත් බය නෑ.
ඕනෙ තරම් මුට්ටියට කෙටුවාදෙන්."
බුහුකි මුට්ටිය ඔළුවෙ දාගෙන වළං මැස්ස යට හැංගුණා.
ඔන්න එතකොටම චූටි බබාලා ඉස්කෝලේ ගිහින් ගෙදර ආවා.
කුස්සිය පිටිපස්සෙ ඉන්න අමුතු සතා දැකලා චූටි බබාලා ටිකත් බයවෙලා කෑ ගහගෙන දිව්වා.
එයාලාටත් අඳුනගන්න බැරි වුණා මේ බුහුකි කියලා.



බබාලාගේ කෑ ගැහිල්ලට බුහුකිත් බය වුණා.
එයා එක පිම්මට ගෙදර දිව්වා.
මග දිගට සත්තු මිනිස්සු හැමෝම බයවෙලා
ඔළුව හැරුණු අතේ දිව්වා.
දැන් මුළු ගමම බයවෙලා බුහුකිට.



බුහුකි හති දාගෙන ගෙදරටම දිව්වා.
සුදු ඇඳගෙන ඔළුවෙ කලු තොප්පියක් දාගෙන මොකෙක්දෝ
අමුතු සතෙක් ගේ දිහාවට එනවා, බුහුකිගේ ගෙදර අය දැක්කා.

"හපෝ--යි----! ඔය නම් වෙස් මාරු කරගත් යකෙක් තමයි."

"අපි ඉවරා---යි"
බුහුකිගේ අත්තම්මා කෑ ගහගෙන දිව්වා.





"බුහුක් - බුහුක් - බුහු - බුහු- බොහෑ---බොහෑ -----"
නැන්දලා මාමලා සීයලා හැමෝම බයවෙලා
ගස් අතු පෙරළාගෙන දිව්වා.
බුහුකිගේ අම්මාත් තාත්තාත් ඒ පස්සෙන් දිව්වා.
බුහුකිත් එයාලාගෙ පස්සෙන් දිව්වා.
බුහුකි පස්සෙන් එනවා දැකලා එයාලා තවත් බයවෙලා
තවත් හයියෙන් දිව්වා. හරියට අල්ලන සෙල්ලම් කරනකොට වගේ.
බුහුකිත් පුළුවන් තරම් හයියෙන් එයාලා පස්සෙන් දිව්වා.



දැන් බුහුකිට හරිම මහන්සියි, ඇඬෙන්නත් එනවා.
"අනේ අම්මා ! දුවන්න එපා මම බුහුකී---!"
බුහුකි පුළුවන් තරම් හයියෙන් කෑ ගැහුවා.
බුහුකිගේ අම්මට යන්තම් බුහුකිගෙ කටහඬ ඇහුණා.
අම්මා ඉක්මනට හැරිලා බැලුවා.
"ම්---ම්---කටහඬ නම් බුහුකිගෙ වගේ. ඒත් මේ මගේ බුහුකිමද?"
අම්මා නතර වෙලා කල්පනා කළා.
අනෙක් අයත් ටිකක් ඈතට දුවලා නතරවෙලා බලාගෙන හිටියා.
බුහුකි අම්මා ළඟට දුවගෙන ආවා.

"අම්මා ! අම්මා ! මේ මම -----!"
එයා අම්මාට තුරුළුවෙලා කීවා.

"අනේ මේ මගේ පුතා නේද ?"
අම්මා බුහුකිගේ මුහුණ පිසදාලා බැලුවා.

එයාගෙ මූණෙ හැටි දැකලා අම්මාට හරි හිනා.
බුහුකිටත් හරි හිනා.
හැමෝටම හරි හිනා.
"හිකි - බක - බක - බුකු - බුකු - බුහුක් - බුහුක් ----"

